# සෙනසුරාදා

## පළමුවන කියැවීම

ද්විතීය නීති සංග්‍රහයෙන් ගත් පාඨයෙකි.

ද්විතීය නීති සංග්‍රහය 26: 16–19

**ඔබ සමිඳාණන්ට කැප වූ ජනතාවකි.**

"මෙදින දෙවි සමිඳාණන් වහන්සේ මේ නීති හා නියෝග පිළිපැදීමට ඔබට අණ කරන සේක. එබැවින් ඔබ, ඔබේ මුළු හෘදයෙන් ද ඔබේ මුළු සිතින් ද ඒවාට අවනත වී පිළිපැදිය යුතුය. ඔබ සමිඳාණන් වහන්සේ ඔබේ දෙවියන් වහන්සේ බව අද පිළිගෙන දෙවි මඟ යාමටත්, උන්වහන්සේගේ නීති, නියෝග සහ අණ පණත් පිළිපැදීමටත්, උන්වහන්සේට කීකරුවීමටත් පොරොන්දු විය යුතුය. ඔබ උන් වහන්සේගේ අණපණත් සියල්ල පිළිපදින්නහු නම් උන් වහන්සේ පොරොන්දු වූ ප්‍රකාර ඔබ තමන් වහන්සේගේ විශේෂ සෙනඟක් මෙන් අද දින පිළිගන්න බව ප්‍රකාශ කරන සේක. තවද, දෙවි සමිඳාණන් වහන්සේ වදාළ ප්‍රකාර ඔබ උන් වහන්සේට කැප වූ ජනතාවක් වන පිණිස තමන් මැවූ අන් සියලු ජාතීන්ට වඩා කීර්තියෙන් ද මහිමයෙන් ද ගෞරවයෙන් ද ඔබ උසස් කරන සේක.

දේව වාක්‍යය එසේය.